## පච්චිලායිපල්ලි ප්‍රාදේශීය සභාව .

### 1 . මූල්‍ය ප්‍රකාශන.

### 1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම .

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 15 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 04 දින ඉදිරිපත් කරන ලදී . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 මැයි 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි .

### 1.2 . මතය .

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පච්චිලායිපල්ලි ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවටත් , සභාපතිවරයා වෙත යවන ලද වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට පච්චිලායිපල්ලි ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ .

### 1.3 . මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් .

#### 1.3.1 . ගිණුම්කරණ ප්‍රතිපත්ති .

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය කර නොතිබුණි .

#### 1.3.2 . ගිණුම්කරණ අඩුපාඩු .

වියදම් , ආදායම් සහ වත්කම් සම්බන්ධයෙන් ගණුම් වල නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පහත වගුවෙහි දැක්වේ .

| මූල්‍ය ප්‍රකාශන මත වන බලපෑම . | වියදම් . | | ආදායම් . | | වත්කම් . | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථාව සංඛ්‍යාව . | වටිනාකම . රු . | අවස්ථා සංඛ්‍යාව . | වටිනාකම . රු . | අවස්ථා සංඛ්‍යාව . | වටිනාකම . රු . |
| වැඩියෙන් දැක්වීම් . | 01 | 16,000 | - | - | - | - |
| අඩුවෙන් දැක්වීම් . | - | - | 01 | 144,161 | 02 | 592,688 |

1.3.3 . විගණනය සඳහා සාක්ෂි නොමැති වීම .

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම .

අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.9,956,790 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය .

1.3.4 . ගෙවිය යුතු ගිණුම් .

2011 දෙසැම්බර් 31 දිනට වර්ෂයක කාල පරිච්ඡේදයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් ගේ වටිනාකම රු.46,800 ක් විය .

1.3.5 . අනුකූල නොවීම් .

පහත සඳහන් නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන් හි විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය .

| | නීති , රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට යොමුව . | | අනුකූල නොවීම . |
|---|---|---|---|
| ( අ ) . | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 11 පරිච්ඡේදයේ 19 ( 1 ) වගන්තිය . | - | චලනය වන සහ චලනය නොවන වත්කම් වලට අදාල ලේඛණ සභාව විසින් පවත්වා නොතිබුණි . |

( ආ ) . ප්‍රාදේශිය සභා (මුදල් සහ පරිපාලන) රීති - 1988 .

| | | | |
|---|---|---|---|
| ( i ) | 11 පරිච්ඡේදයේ 5 වගන්තියේ xii උප වගන්තිය . | - | මුදල් සහ ගබඩා සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් ගෙන් ආරක්ෂක තැන්පතු ලබා ගෙන නොතිබුණි . |
| ( ii ) | v පරිච්ඡේදයේ 140 වගන්තිය . | - | රු.78,855 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීම සඳහා සභාපතිවරයා කටයුතු කර නොතිබුණි . |

( ඇ ) . චක්‍රලේඛ

-----------

| | | |
|---|---|---|
| අංක 41 / 90 හා 1990 ඔක්තෝබර් 10 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය . | - | චක්‍රලේඛය ප්‍රකාරව වාහන වල ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි . |

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

--------------------------------------

2 . 1 . මූල්‍ය ප්‍රතිඵල .

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම ව ආදායම් අතිරික්තය රු.1,097,202 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම් අතිරික්තය රු.1,690,373 ක් විය .

2.2 . ආදායම් පරිපාලනය .

------------------------

2.2.1 . ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම .

---------------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් විෂයය . | 2011 | | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම . |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත රු " 000 | තථ්‍ය රු " 000 | රු " 000 |
| වරිපනම් සහ බදු | 18 | 10 | - |
| කල්බදු කුලී | 2,392 | 2,851 | - |
| බලපත්‍ර ගාස්තු | 86 | 99 | - |
| වෙනත් ආදායම් | 14,665 | 12,576 | 1,340 |
| එකතුව . | 17,161 | 15,536 | 1,340 |

2.2.2 . මුද්දර ගාස්තු .

ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කොට අදාළ තොරතුරු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැන්වීම් සඳහා සභාව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි .

2.2.3 . ප්‍රචාරන දැන්වීම් පුවරු සහ දුරස්ථ සන්නිවේදන කුළුණු .

( අ ) . ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කරන ලද ප්‍රචාරණ දැන්වීම් පුවරු වෙනුවෙන් වු රු .90,000 ක් වු ගාස්තු අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණු බැව් ක්ෂේත්‍ර පරික්ෂණයක දී අනාවරණය විය .

( ආ ) . සභාවේ බල ප්‍රදේශය තුල ස්ථානගත කර තිබු මොබිටෙල් කුළුණ සහ ඩයලොග් කුළුණ සඳහා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

2.3 . වත්කම් කළමනාකරණය .

2.3.1 . නිෂ්ක්‍රිය සහ ඌන උපයෝජිත වත්කම් .

( අ ) . රු.882,570 ක් වූ පිරිවැයකට පුතුකඩු මංසන්ධියේ ඉදි කරන ලද නව වෙළඳ පොල ගොඩනැගිල්ල 2011 ජුනි මාසයේ සිට නිෂ්ක්‍රියව තිබුණි .

( ආ ) . වටිනාකම රු.54,000 ක් වූ ගේට්ටු දෙකක් වර්ෂයක කාලයක් සභාවේ නිෂ්ක්‍රියව තබා තිබුණි .

2.3.2 . ලැබිය යුතු ගිණුම් .

2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශෙෂයන් ගේ ප්‍රමාණය රු.1,340,029 ක් විය .

2.3.3 . අයවිය යුතු සේවක ණය .

2011 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු සේවක ණය ශේෂයන් ගේ එකතුව රු.2,537,246 ක් වූ අතර වර්ෂයකට අධික කාලයක් හිඟ හිට තිබූ ශේෂයන්ගේ එකතුව රු.1,211,245 ක් විය .

2.4 කාර්ය සාධනය .

සභාව ගිණුම් වර්ෂය ආරම්භයේ දී වාර්ෂික ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි . එම නිසා , සපුරා ගැනීමට අපේක්ෂිත අරමුණු සහ ඒවායේ ප්‍රගතිය සොයා දැනගත නොහැකි විය .

2.5 . කළමනාකරණ දුර්වලතා .

( අ ) . වාහන 06 ක අයිතිය මාරු කිරීම සඳහා මේ වන තෙක් කටයුතු කර නොතිබුණි .

( ආ ) . අයවැය ලේඛණයේ ප්‍රතිපාදන නොතිබිය දී මුල්ලිපත්තු උප කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රු.101,688 ක මුදලක් වැය කර තිබුණි .

2.6 . කොන්ත්‍රාත පර්පාලනය .

ප්‍රසම්පාදන පර්පාටිය අනුගමනය නොකොට ඉයක්කච්චි උප කාර්යාලයේ වැට ඉදිකිර්ම සඳහා රු.88,435 ක මුදලක් වැය කර තිබුණි .

2.7 . අභ්‍යන්තර විගණනය .

ප්‍රාදේශිය සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සදු කර නොතිබුණි .

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) . ගිණුම්කරණය .

( ආ ) . අයවැය ලේඛණයමය පාලනය .

( ඇ ) . ආදායම් රැස් කිරීම .

( ඇ ) . කොන්ත්‍රාත් පරිපාලනය .